MARCH 2017
www.sannasa.com

## අඬෝමැයි

රනිල් වික්‍රමසිංහ අගමැති වරයා වෙනුවෙන් මෙල්බන්හි පැවැති උත්සවයකී කෙරෙන විරෝධතාවයන් ගැන SBS සිංහල සේවයෙන් කෙරුණු පූර්ව ප්‍රචාරය අහලා ඒක බලන්න යන්න හිතුනේ අලුත් අද්දැකීමක් ලබාගන්න අදහසකින්. මේ දවස්වල විරෝදතා නම් මෙහේ කෙසේ වෙතත් එහේ නම් ඇමතිවරයන් ඉදලා කම්කරුවා දක්වාම පැතිරිලා ගිහින්නේ. ඉතිං මෙහෙදි මෙහෙම වැඩක් දැකලා නැති නිසා මොකද වෙන්නෙ




කියලා බලන්න හිතුනේ. මාර දුකයි ලොක්කා ඒ විරෝධතාවෙ ස්වභාවය දැකලා. ඒත් මේ ප්‍රතිරෝධතාවයේ එලි දක්වපු දියාරු ස්වභාවය දැක්කම මාර ලැජ්ජ හිතුනා. මේ මිනිස්සු මීට කලින් කොයි තරම් සාර්ථක විරෝධතා සංවිධානය කළ මිනිස්සුද කියලා.

කොටින්ට එරෙහිව මිනිස්සු එකතු වෙන්නේ වෙනම චිත්තනයකින්. ඒ සිස්ටම් එක හැම තැනටම යොදා ගන්න අමාරුයි. අනෙක මිනිස්සු දැන් දියුණු මාධ්‍ය නිසා හැම දේ ගැන දැනුවත්. යමක් කරන්න ප්‍රථම දෙපාරක් හිතනවා. ඉතිං එහෙම මිනිසුන්ව ව්‍යවස්ථා සංශෝධන, රට බෙදීම ඉඩම් විකිණීම වගේ පට්ට ගහපු යල්පැන ගිය සටන් පාඨ වලින් එකතු කරන්න අමාරුයි.

මේවා දැකලා රනිල්ට හිනා යන්නත් ඇති. මිනිස්සු විරෝධය දක්වන්න ඕනේ හැඟීමෙන් හා දැනීමෙන්. නැතුව එකාඑකාගෙ අවශ්‍යතාවන් ඉටු කරන්න නොවෙයි.

මේ පුවරු උස්සගෙන ඉන්න මිනිස්සු දැන ගන්න ඕනෙ ඒවයෙ අන්තර්ගතය ගැන. දේශපාලන වශයෙන් පාරාජිකා වෙච්ච මිනිස්සු වෙනුවෙන් මෙහෙමත් කඩේ යන්න ඕනෙද කියලා මට ආපහු එද්දි හිතුනේ.

නිකමට හරි කවුරු හරි ඇවිත් අහුව නම් මේ ව්‍යවස්ථා සංශෝධනය කොහේ තියෙන එකද්ද කියලා මොකද්ද දෙන උත්තරේ? මේ ව්‍යවස්ථා සංශෝධනය කොහේ තියෙන එකක් කියලා කියන්නද? පාර්ලිමේනතුවටත් ගෙනත් නැති පනතක් ගැන විරෝධතා දක්වන්නේ අර සුමනදාසගෙන් වත් උපදෙස් අරන්ද මන්ද? අඩුම ගානේ අධ්‍යාපනය පෞද්ගලීකරණයට විරුද්ධ වෙයල්ලකො. එහෙමත් නැහැ.

**අගමැතිටයි ජනාධිපතිටයි විරුද්ධව ඕනේ විධියට විරෝධය දක්වලා යහතින් ගමරටවල් බලා ගිහින් එන්න ලැබීමත් කොපමණ වෙනසක්ද කියලා මේ අය තේරුම් ගන්නේ කවද්ද කියලයි මට හිතුනේ. පත්තරේට ලියුවත් කතා කරලා ගහන්න මරන්න හදන කාලයකුත් අපි පහුකරානේ කියලා මතක් වෙලා.**
**ඇත්ත** තමයි ප්‍රජාතන්ත්‍රවාදය ලැබිය යුත්තේ දැනුවත් සමාජයකට කියන කතාව ඇත්තකි. එහෙම නැති වුණාම ඒ අයිතීන් භුක්ති විදින්නේ විකාර විදියට. ඒ විකාර මෙහෙදි දැනුවත්භාවයෙන්ම කරන එවුන්ට කියන්නෙ මොකද්ද කියලා හිතලා මගේ ඔළුවත් අවුල් වෙලා හලෝ....

## සහෝදර ප්‍රේමය

මේ කෙටි ලිපි තීරුවට ලංකාවේ සිදුවම් මාතෘකා කරගන්නේ නැතය කියන තැන හිටියත් සමහර වෙලාවට එයින් පිට පනින්න වෙනවා. අපි හැමෝම ලියන්න කියන්න ඉගෙනගත්ත අපේ අධ්‍යාපනය එහෙම එකක්. ලංකාවේ පෞද්ගලික අධ්‍යාපනය හා පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ගැන අපේ අදහස පසුගිය කාලේ අපි කිව්වනේ. ඒත් මේ පෞද්ගලික වෛදන විද්‍යාලයක් වන සයිටම් ආයතනය සම්බන්ධයෙන් ඇති ඇති දේශපාලමය තත්වය ගැන නොලියාම බැහැ. මොකද ඒක කලින් කලට වෙනස් වන නිසා.

දැන් මේ ගේමේ මේකට විරුද්ධ පැත්තේ කොටස් හතරක් ඉන්නවානේ. අන්තරේ, ජවිපෙ, දොස්තරලා සමග මහින්දගෙ ඒකාබද්ධේ. මේකෙන් ඒකාබද්ධෙ කරන්නෙ බොර දියේ මාලු බාන එකය කියල අපි හැමෝම දන්නවනෙ. දොස්තරලත් ඉදිරියේදි මේකට පක්ෂ වෙන්න නියමිතයි. කාලය පිලිබඳ පොඩි ප්‍රශ්නයක් විතරයි තියෙන්නෙ. ඉතුරුවෙන්නෙ ජවිපෙ සහ අන්තරේ හෙවත් පෙරටුගාමීන් විතරයි. ඒකෙනුත් මට වැදගත් වෙන්නෙ ජවිපෙ විතරයි. මොකද බොහෝ අඩුපාඩු මැද වුණත් අපට විශ්වාසය තැබිය හැකි බොහෝ පුද්ගලයන් ඉන්න එකම පක්ෂය එය නිසා. රටේ මහජනතාව මෙතුවක් කාලයකට ඔවුන්ට බලය නුදුන්නත්



ඔවුන් අවංක බව වැඩි දෙනෙකුගේ පිළිගැනීමයි. මේ පුද්ගලික අධ්‍යාපන ආයතන සම්බන්ධයෙන් ඔවුන් දක්වන මතය සම්බන්ධයෙන් පසුගිය කාලය පුරාවට පළවූ ලිපි ලේඛණ කියවා බැලුවහොත් මේ ආයතනය වසා දැමීමට නොව රජය සතු කර ගැනීමට හෝ රජයේ නියාමනයට යටත්ව පවත්වාගෙන යා යුතුය යන ස්ථාවරයට මාරුවීමට බොහෝ ඉඩ කඩ තිබුණ බව පෙනී යනවා. සමහරවිට රටේ බහුජනතාවගේ මතයට සමපාත වීමට හා 2020 දී බලය ලබා ගැනීමේ අරමුණෙන් විය හැකිය. ඔවුන් අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීමට ප්‍රතිපත්තියක් වශයෙන් පමණක් විරුද්ධ වීමට ඉඩ කඩක් තිබුණ බව පෙනුණා. එය බොහොම ඉදිරිගාමී දෙයක් විදිහටයි චූටි මල්ලිලා පවා දැක තිබුණේ. ඒත් හදිසියේම ඒකාබද්ධේ පසු බැසීමත් දොස්තරවරු සහ ජනාධිපති අතර සාකච්ඡාවෙන් පසු දොස්තරවරුන්ගේ පසුබැස්ම හමුවේ සයිටම් විරෝධී කොඩිය පෙරටුගාමීන් අතට පත්වීම වැළැක්වීම පිණිස නව ජවයකින් ජවිපෙ ඉදිරිපත්වීම අදහාගත නොහැකි කාරණයක්. වැරදිලාවත් මෙහිදී ජවිපෙ නිහඬව කොඩිය පෙරටුගාමීන් අතට දී බලා සිටියා නම් එයම පෙරටුගාමීන්ගේ ගමනක අවසානය වන්නටත් ඉඩ තිබුණා.

ඒත් නැවතත් ජවිපෙ රටේ මතයට පිටුපාමින් පෙරටුගාමීන් හා එක්ව සටනට බැසීමෙන් කළේ පෙරටුගාමීන් හා කුමාර් ගුණරත්නව දේශපාලන විනාශයකින් බේරාගැනීමත් තමන් විසින්ම තම අත පය කඩා බිඳ දමා ගැනීමක් කියලයි මට හිතෙන්නෙ. එක අතකින් ජවිපෙ තමන්ගෙ පරණ සහෝදරයන් වැටෙන්න ගිය වලෙන් ඒ අය බේරාගෙන තමන් ඒ වළට පැනීම දෛවයේ සරදමක් වගෙයි. ඒ ගැන මගේ ශෝකය. මගේ පොඩි අයියලා තවත් කාලයක් කොඩි වැල් අදීවි. පෝස්ටර් ගහවි.

අනේ අපි කවදාක....



හැබැයි ගෑනු පක්ෂය නම් එකහෙළාම විරෝධය තමයි පෙන්නුවෙ. "වයස පරතරය වැඩියි" " වික්ටර්ට වයස ගියා වැඩියි"
"එයාට තිබුණෙ අවුරුදු පනහක විතර කෙනෙක් බඳින්න"
අප්පා.. කතා ගොඩයි.. වරද වික්ටර්ටම තමයි පැටවුණේ.

## Let them live their life...

ඊයේ ගියා පොඩි සාදයක අතුරු කතා නැතිව කෙලින්ම කාරණාවට එමුකෝ. එතන හිටිය ගෑන් පිරිමි සියලු දෙනාගෙම මාතෘකාව වික්ටර්. මොන වික්ටර් ද? වික්ටර් මිගෙල් ද? වික්ටර් හාරා ද? නැහැ. අපේ ප්‍රවීණ ගායක වික්ටර් රත්නායක. අපේ සිසිර අයියා ඔහුගෙ නිර්මාන ගැන පොතක-ත් ලියලනේ. ඉතිං මොනාද කට්ටිය කතා කළේ? ඔහුගෙ ගීත ගැන? සංගීත භාවිතාව ගැන? අනේ අපේ කට්ටිය ඒ එකක් ගැනවත් නෙවෙයි කතා කළේ. එයාලගෙ මාතෘකාව වුණේ වික්ටර්ගෙ පවුල් ජීවිතේ... අලුත් විවාහය.



මිනිස්සු ප්‍රශ්න හදාගන්නෙ සමහර දේ ගැන මාර කෝණ වලින් බලලා. එක අතකට මිනිස්සුන්ට බනින්නෙ කොහොමද? මේ වැඩේ මේ විදිහට පත්තුවුණේ ලෙලුම් ගේ මූණු පොතේ පනිවුඩයෙන්නෙ. කවුරුත් දැනගෙන නොහිටපු දෙයක් පබ්ලික් කළේ එයානෙ. එතකල් ඕක කවුරුත් දැනගෙන හිටියෙ නැහැ. දැනගෙන හිටිය අයටත් ඒක ප්‍රශ්නයක් වුණේ නැහැ.

අපේ රටේ හැදුණ වැඩුණ උදවිය මානව සම්බන්ධතා දිහා බලන්නෙ හරිම පටු කෝණ වලින්. ඒ අය හැද දේම මනින්නෙ ලිංගික හා දේපල කියන සාධක දෙක ඉස්සරහට දාගෙන. ඉතින් වියපත් මිනිහෙක් තරුණ ගෑනියෙක් බඳින එකත් තරුණයෙක් වියපත් ගැහැනියක් බඳින එකත් අපට මාර ප්‍රශ්නයක් වෙනවා.

දැන් මාතෘකාව නැගලා යනවා. පාටියේ හිටපු පිරිමි බොහෝ දෙනෙක් වික්ටර් අනුමත කළත් නිකම් පොඩි විචිකිච්චාවක ඉන්නවා වගේ ගතියක් මට දැනුණා.

කෙනෙකුගේ ජීවිතේ අභ්‍යන්තර ප්‍රශ්න ගැන කිසිවක් නොදැන අපි කොහොමද පිටත ඉඳන් එයා ගැන එක එක නිගමන වලට එන්නෙ? විනිශ්චය කරන්නෙ.?

මට මතක් වුණෙ කලකට ඉස්සෙල්ලා ජෝති ලතාව බැඳලු වෙලාවෙ මිනිස්සු කියපු කතා. ඒ දෙන්නම එක වයසෙ වුණත් කියපු කතා වල අඩුවක් තිබුණද?

වයසක මිනිහෙක් විවාහ කරගත යුත්තේ වයසක ගැහැනියක් මය. වයසක ගැහැනියක් විවාහ කරගතයුත්තේ වයසක මිනිහෙක්වය කියලා නීති කොහෙවත් තියෙනවද? ඔය පිස්සු කතා කියන්නෙ හැම දේම ලිංගිකත්වය මත තීරණය කරන ලිං මැඩි මිනිස්සු. මට නම් හිතෙන්නෙ අපි මොකටද අනුන්ගෙ ජීවිත වලට මේ විදිහට ඇඟිලි ගහන්නෙ කියන එකයි. Let them live their life...

මේ කිසිම කාරණයක් වික්ටර්ට අපේ ඇති ගෞරවය සහ ආදරය දෙදරවන්නත් ඔහුගෙ මිහිරි ගීත වලට අපේ ඇති ආදරය බිඳ දමන්නවත් හේතු වෙන්නෙ නැහැ.

මිනිසුනි.. ආදරය තේරුම් ගන්න.. එයට වයස් බේධයක් නැහැ..

## අන්න මැච්

බැන බැන හිටියට මැච් දෙකම බලන්න ගියා. අන්න දරුවනේ මැච්. ඇගේ මයිල් ස්මයිල් වුණා කිව්වොත් හරි. අලුත් කොල්ලො සෙට් එක අපි වගේ සැබෑ ක්‍රිකට්




ලෝලයන්ව නැවත ක්‍රිකට් පිටියට ඇදලා ගත්තා කිව්වොත් නිවැරදියි. අන්තිම ගේමත් අතේ තිබුණ එකක්. නිකං අතඇරියේ.

පරාජිත මානසිකත්වයෙන් මිදීමත් ජයග්‍රාහී මානසිකත්වය දිගටම රැක ගැනීමත් දැන් ක්‍රිකට් වලට අත්‍යවශ්‍යම දෙයක්. අපට බොහෝ වෙලාවට නැත්තෙම ඒ කාරණය තමයි.

කමක් නැහැ. කාලෙකට පස්සෙ දුන්න ආතල් එකට මෙන්න මල් මිටක්.

**චූටි මල්ලි**